# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1515/22 – 2007 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා – 2007.09.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක 16.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(1) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් දේශීයව සාදනු ලබන හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන සිවුරු, අට පිරිකර හා පාත්‍ර පිළිවෙලින් ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර SLS 1257 (සංශෝධන 1:2006), SLS 1258 (සංශෝධන 1:2007), SLS 1308/2007 වලට අනුකූල වන්නේ නම් මිස කිසිම නිෂ්පාදකයෙකු හෝ වෙළෙන්දෙකු විසින් සිවුරු, අටපිරිකර හෝ පාත්‍ර නිපදවීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ගබඩා කර තැබීම නොකළ යුතු යැයි මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය 2007 නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

සරත් විජේසිංහ,
සභාපති.

2007 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

10–243/1

---

විධාන අංක 17.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) (ආ) (ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) (ආ) (ii) යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, කිසියම් නිෂ්පාදකයෙකු, වෙළෙන්දෙකු හෝ බෙදාහරින්නෙකු විසින් 'හලාල් ' සහතිකයක් නිකුත් කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද 'හලාල් ' සහතිකයක් නොමැතිව "හලාල්" යන පදය හෝ එහි අර්ථය නිරූපනය වන සේ යම් චිත්‍රයක් හෝ සංකේතයක් සහිතව ආහාර වර්ග හෝ බීම වර්ග නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් විධානය කරනු ලැබේ.

මෙම විධානය 2007 නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

සරත් විජේසිංහ,
සභාපති.

2007 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

10–243/2

1A-PG 000833 - 490 (2007/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.